

# සමාවන්න

## ලියා දන්වන වග යි

සමාජ ගත කිරීම සඳහා යි පවසමින් ආදි වාසී දැරුවන් පැහැරගැනීමේ ඛෙදවාචකය ඔස්ට්‍රේලියාවේ ඉතිහා- සයේ කලු පැල්ලමක් ලෙසින් සටහන්ව තිබේ. මා පියන් හඬා වැටෙද්දී දරුවන් හඬා වැටෙද්දී මවුන් ඇකයෙන් බලෙන් පැහැර ගනු ලැබූ මේ දරුවන්ගේ කතාව අසා සිටීම හද කම්පා කරවන අද්දැකීමකි.

මේ ඛෙදවාචකය නිමිති කර තනිමින් සාහිත්‍ය නිර්මාණ බිහිවිය. සිනමා පට බිහිවිය. ඒ සියල්ලෙන් පිළිබිඹු කෙරුණ මනුෂ්‍යත්වයේ කතාව තේරුම් ගන්නට පාලකයන් අසමත්ව සිටියා සේ ය.

ජීවිත කාලයක් පුරා මව්පිය සහෝදර සෙනෙහස අහිමිව හුදකලා කරනු ලැබූ මේ අසරණයන් පසුගිය අවුරුදු කීපය තුළ ම ඉල්ලා සිටියේ එක් දෙයකි.



සේයාරුව ÷ දසුන් ගජමන්

''අපට කළ වරද නැවත සෑදිය නොහැකි ය. අපේ හදවත් වල කැකෑරෙන වේදනාව සමනය කරනු සඳහා අඩුම වශයෙන් අපෙන් සමාව ඉල්ලපල්ලා''

උද්ධච්ඡ කමින් සිත් පුරවාගත් දේශපාලකයෝ මේ සාධාරණ ඉල්ලීම දෙස ඇස් ඇර බලන්නට වත් නොවෙහෙසුණ හ. සමාව ඉල්ලනවා වෙනුවට වහසි බස් දෙඩූ හ. මේ උද්ධච්ඡයන් කුණු බක්කියටම පන්නා දමා බලයට පත් නව රජය සිය මැතිවරණ පොරොන්දුව ඉටු කරමින් පෙබරවාරි 13 වන දින ආදි වාසීන්ගෙන් සමාව ඉල්ලා සිටියේ ය. මේ ඉතිහාස ගත වන දිනයේ ආදි වාසීන් හා එක්ව හරි හරියට සුදු මිනිස්සු ද හැඬූහ. මිනිසත් කම හඳුණන සෑම මිනිසකුගේම ඇස් කඳුළින් තෙත් විය.

සමාව ඉල්ලමින් අගමැති කෙවින් රඩ් මහතා කළ කතාව ඉතාම හැඟුම් බර එකක් විය. ලක්ෂ ගණනකගේ පැසසුම් ඔහුට හිමි විය. එය එසේ විය යුතුම ය. ඔහුගේ කතාව අසමින් හඬා වැටුණේ ආදිවාසීන් පමණක් නොවේ.

ඉතිහාසය පුරාම බලය ඇත්තෝ බලය නැත්තන් පාගා දැමූ හ. බලය නැත්තන් ගේ අයිතිවාසිකම් බලය ඇත්තන් විසින් උදුරා ගනු ලැබීමේ අභාග්‍යය අපි වරින් වර කියවා ඇත්තෙමු. එනමුදු 'අප කල වරදට සමාවන්න' යයි කියනු අපට ඇසුණ පළමුවන වතාව මෙය විය. ඒ වාසනාව අපට ලබාදුන් ඔස්ට්‍රේලියානු අගමැති කෙවින් රඩ් මහතාට අපේ හිස් නමා ආචාර කරමු.

නව සහශ්‍රයට
සන්නස
නව ලිපිනය
61 Nattle Drive
Hallam Vic 3803
Australia



## නිදහස් සුවඳ

ඇතිකොට හැම හිතකම දෑ පේමය
ලක් මව ගෙළ බැඳ සමගියෙ දාමය
දුරුකොට හිස ඔසවන බල කාමය
නිදහස අප රැ ක ගත යුතු වේ මය

සිරිලක එක පොළොවකි යන අදහස
පිළිබඳ ඇතැමෙකු පෑවද උදහස
එඩිතර රණවිරු පුතුනගෙ මඳහස
පවසනු ඇත සුරකින යුරු නිදහස

සිඳ බිඳ තෙද බල අදිරද බැම්මේ
හැට වසරක ගමනකි ආ පිම්මේ
නිදහසමය අමතක කර දැම්මේ
තව දුර යා යුතු සිරිලක් අම්මේ

නිදහස් තිළිනය අප සැම හමුවේ
රන් බඳුනක දා නැහැ පිරිනැමුවේ
හෙළ රුදිරය සිරිලක් බිම තෙමුවේ
නිදහස් මල් සුවඳක්මය හැමුවේ

දෑ අබිමන පැවැසෙන නිල් ගුවනයි
තුන් හෙළයට හෙළ දජයෙහි සෙවනයි
මුළු රට සිප එන නිවහල් පවනයි
මේ සිරිසර අප සැම ලද නිවනයි

ජගත් වෙත්තසිංහ

සංස්කරණය/Editor
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**ක්‍රීඩා සංස්කාරක**
අසෝක සිල්වා Asoka Silva

**තාක්ෂණ සහය**
දසුන් ගජමන් Dasun Gajaman

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**
**NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055
**WA** Kapila Hemantha Balage 08 9456 1972
**QLD** Ananada Samaratunga 07 3372 7953
**ACT** Asoka Nimalasiri 0400 429 031
**SA** Chandra Eeriyagama 08 8331 2318
**TAS** Anura Seneviratne 03 6327 4259

**Sannasa**
61 Nattle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.